ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනපති උපාධි වැඩසටහන

අවසාන පරීක්ෂණය -2019/2020

**STP 9811 /ESP2311**- අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම

කාලය - පැය තුන (03) යි.

---

දිනය : 2020.10.03 වේලාව : පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

ඕනෑම ප්‍රශ්න හතරකට **(04)** පිළිතුරු සපයන්න.

01. (i) ආයුකාල සංවර්ධන එළඹුමෙහි මූලධර්ම පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) ගුරුවරයෙකුට ආයුකාල සංවර්ධනය පිළිබඳව හැදෑරීමේ වැදගත්කම හේතු දෙකක් **(02)** නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii) ආයුකාල සංවර්ධනය එළඹුම යටතට ඇතුළත්වන ෆ්‍රොයිඩ්ගේ මනෝ විශ්ලේෂණවාදී න්‍යායයේ සහ එරික් එරික්සන්ගේ මනෝ -සමාජයීය න්‍යායයේ අදහස් අතර ඇති සමානතා සහ අසමානතා පැහැදිලි කරන්න. (ලකුණු 09)

02. (i) පුද්ගලයෙකුගේ භාෂාව සංවර්ධනය සහ ප්‍රජානන සංවර්ධනය අතර අන්තර් සම්බන්ධතාව පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) භාෂා සංවර්ධනය සංකල්ප සාධන ක්‍රියාවලියට උපකාරී වේ.

සංකල්ප සාධනයේ පියවර හතර **(04)** කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(iii) දරුවන්ගේ ප්‍රජානන සංවර්ධනය සුසාධ්‍ය කිරීමට විගොට්ස්කිගේ සමාජ සංස්කෘතික න්‍යායයේ අදහස් ගුරුවරයෙකුට යොදා ගත හැක්කේ කෙසේදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 12)

03. (i) ඉගෙනුම් න්‍යායයන්ගේ මූලික මූලධර්ම හැදෑරීම ගුරුවරයෙකුට වැදගත්වන්නේ ඇයිදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(ii) චර්යාවාදී න්‍යායන් සහ ප්‍රජානන න්‍යායන් අතර ඇති ප්‍රධාන වෙනස්කම් පහත අංශ යටතේ පැහැදිලි කරන්න.

(අ) සංජානනය

(ආ) පෙළඹීම

(ඇ) ඉගෙනුම් ක්‍රියාවලිය (ලකුණු 09)

(iii) ගෙස්ටාල්ට් න්‍යායට අදාළව ඉගැන්වීම්-ඉගෙනුම් ක්‍රියාවලිය තුළ ගුරුවරයාගේ භූමිකාව විභාග කරන්න. (ලකුණු 10)

04. මිනිසුන්ගේ චිත්තවේගවල ස්වභාවය විවිධ මනෝ විද්‍යාඥයින් විසින් විවිධ න්‍යායයන් මගින් පැහැදිලි කර ඇත.

(i) ඕනෑම න්‍යායකට අදාළව චිත්තවේගවල ස්වභාවය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) (අ) චිත්තවේග ගැටලු සහිත කුඩා දරුවන් තුළ දැකිය හැකි ලක්ෂණ හතරක් **(04)** දක්වන්න. (ලකුණු 04)

(ආ) මැද සහ පසු ළමාවියේ චිත්තවේගීය ගැටලුවලට හේතු තුනක් **(03)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) දරුවන්ගේ මානසික යහපැවැත්මට උපකාර කිරීමට ගුරුවරයෙකුට යොදාගත හැකි ක්‍රියාමාර්ග තුනක් **(03)** සාකච්ඡා කරන්න. (ලකුණු 09)

05. (i) පිළිගත් නිර්වචනයක් යොදාගෙන ‘පෞරුෂය’ යන සංකල්පය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ii) පෞරුෂ සංවර්ධනය පිළිබඳව කාල් රොජර්ස් (මානවවාදී ප්‍රවේශය) විසින් ඉදිරිපත් කරන ලද මූලධර්ම විස්තර කරන්න. (ලකුණු 10)

(iii) පාසල් දරුවන් තුළ යහපත් පෞරුෂයන් සංවර්ධනය කිරීම සුසාධ්‍ය කිරීමට කාල් රෝජස්ගේ පෞරුෂ න්‍යායයේ මූලධර්ම ගුරුවරයෙකුට භාවිතා කළ හැක්කේ කෙසේදැයි සුවිශේෂී උදාහරණ දෙකක් **(02)** මඟින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

06. සිසුන් එකිනෙකාට වෙනස් ලෙස ඉගෙන ගනී.

(i) 'VAK'(වැක්) ඉගෙනුම් රටා ආකෘතියට අනුව පුද්ගලයන්ගේ විවිධ ඉගෙනුම් රටා වර්ග පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) ඔබ ඉහත පැහැදිලි කළ එක් ඉගෙනුම් රටා වර්ගයක් තෝරාගෙන එවැනි වර්ගයේ ඉගෙනුම ලබන්නන් තුළ විද්‍යාමාන වන ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 07)

(iii) ගුරුවරයෙකුට සිසුන්ගේ ඉගෙනුම සුසාධ්‍ය කිරීමට 'VAK' (වැක්) ආකෘතියේ මූලධර්ම යොදාගත හැක්කේ කෙසේදැයි උදාහරණ තුනක් **(03)** මඟින් සාකච්ඡා කරන්න. (ලකුණු 12)

07. (i) (අ) 'විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමුන් ' යන සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ආ) 'විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමුන්' යටතේ වර්ගීකරණය කරනු ලබන දරුවන් වර්ග හතරක් **(04)** පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවෙකුට අංශ ගණනාවක් ඔස්සේ අමතර සහාය අවශ්‍ය වේ. එසේ ඔවුන්ට අමතර සහායක් අවශ්‍ය වන අංශ තුනක් **(03)** හඳුන්වා ඒවාට අදාළව ගුරුවරයාගේ භූමිකාව පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් අන් සිසුන් සමඟ සාමාන්‍ය පන්තිකාමර තුළට ඇතුළත් කිරීම, ඔවුන් අන් සිසුන්ගෙන් වෙන් කිරීමට වඩා යහපත් වේ. මෙම ප්‍රකාශය හේතු තුනක් **(03)** මඟින් තහවුරු කරන්න.

(ලකුණු 09)

හිමිකම් ඇවිරිණි.